# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදි.

නො. 7,499 — 1925ක්වූ නොවැම්බර් මස 20වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.— හතරවෙනි කාණ්ඩය.

---

### උපාංගනීති.

"1896යේ අංක 13 දරණ වන්දනා උත්සව ආඥාපණත."

වර්ෂ 1897යේ අංක 7 දරණ ආඥාපණතෙන් අලුත්වැඩියාකරනලද වන්දනා උත්සව පිළිබඳ ආඥාවකැයි නම්වූ 1896යේ අංක 13 දරණ ආඥාපණත යටතේ, ලංකා පාලනයෙහි නියුක්ත උතුමාණන්වහන්සේ විසින් කාරක මන්ත්‍රිසභාවේ අනුශාසනය ඇතුව, කතරගම වන්දනා උත්සවය හා පෙරහැර පැවැත්වීම සඳහා විශේෂ ආරක්ෂා වුවමනාවී තිබෙන නිසාත්, වන නිසාත්, ගතවූ වර්ෂ කීපයක් තුළ වර්ෂයක් පාසා පළකරනු ලැබූ ව්‍යවස්ථා වෙනුවට සාදනලද පහත දැක්වෙන ව්‍යවස්ථා හා නියෝග පොදු ජනයාගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධකරනු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

ආර්. එන්. තේන්,
වැඩබලන මහ ලේකම් විසින්.

වර්ෂ 1925ක්වූ නොවැම්බර් මස 17වෙනි දින කොළඹ
මහ ලේකම්තැනගේ කන්තෝරුවේදිය.

### ව්‍යවස්ථා

1. සනීප ආරක්ෂාව සඳහා, කතරගම ඉල්මහ කාච්චි පෙරහැර කාලය සහ වන්දනාකාරයන්ට කතරගම නැවතී සිටිහැකි කාලය දවස් තුනකට, එනම් 1925යේ නොවැම්බර් මස 29වන දින පටන් දෙසැම්බර්මස 1වන දින දක්වා මෙයින් ප්‍රමාණකරනු ලැබේ. පළමු කී දිනට ප්‍රථම පැමිණෙන්නාවූ හෝ මෙහි නියමකළ කාලයට පසු එහි නැවතී සිටින්නාවූ වන්දනාකාරයෝ වරදක් කිරීම ගැන වරදකාරයෝ වෙති.

2. පෙරහැර මංගල්‍යය පවතිනාතර කතරගම යම් වසංගත රෝගයක් ඇතිවුණොත් මංගල්‍යය අවසානවූයේයයි ප්‍රකාශකොට වන්දනාකාරයන්ට නොපමාව ඒ ගමෙන් පිටවී තමතමන්ගේ ගම්වලට යන ලෙස නියමකරන්නටත් අසවල් මඟින් ගමන්කරන්නටය කියා නියමකරන්නටත් නියෝග ඉෂ්ටකරවීම සඳහා පත්ව සිටින නිලධාරීන්ට නීතියේ ප්‍රකාර කළහැක.

3. ව්‍යවස්ථා ඉෂ්ටකරවීම සඳහා පත්ව සිටින නිලධාරීන්ට කතරගමදී සහ කතරගමට යන ගමනේදීද එහි සිට එන ගමනේදීද :

(a) වන්දනාකාරයින්ට රෙදි සේදීමට, නෑමට වතුර ඇදගෙනබීමට, ශරීරකෘත්‍යයන් කිරීමට, වෙන වෙන ස්ථාන නියම කිරීමටද :

(b) ඒ ඒ වර්ගීවල වන්දනාකාරයන්ට නැවතීමට ස්ථාන නියමකිරීමටද ;

(c) වන්දනාකාරයන් කාණ්ඩයක ගමන අසවල් මාර්ගයෙන් වියයුතුයයි නියමකිරීමටද ;

(d) වන්දනාකාරයන්ට දෙන්නාවූ කෑම බෙදාදීම ගැන විධිවිධාන සැලැස්වීමටද ;

(e) ලෙඩවෙන්නාවූ වන්දනාකාරයන් නැවැත්වීමට වෙනම ස්ථාන වෙන්කර තැබීමට සහ ඔවුන් සමග වෙන අයට ගනු දෙනු කතාබස් කිරීමට ඉඩනොදෙන ලෙසටද, ඔවුන්ට ගමන්කරන්නට නුසුදුසුවන්නම් නවත්වා ගැනීමටද බලය තිබේ.

මෙසේ පත්ව සිටින නිලධාරීන්කරන ආඥාවක් කඩකරන අයෙක් ඇත්නම් ඔහු වරදක් කළාක්මෙන් ඒත්තුගනු ලැබේ.

4. ගමනේදී හෝ නැවතී සිටින වාඩියේදී වෛද්‍ය නිලධාරීතැන විසින් හෝ, එබඳු කෙනෙකු නැතිවිටක ප්‍රධාන පොලිස් නිලධාරීතැන විසින්, අපථ්‍යයයි කියන කෑම සියල්ලම තහනමට ගෙන විනාශකර දමන්නට පොලීසියට බලයදී නියමකර තිබේ. මෙම යුතුකම් හෝ මෙම ව්‍යවස්ථාවල නියමකර තිබෙන වෙනයම් යුතුකමක් ඉෂ්ටකරනවිට ඊට විරුද්ධව සිටින නොහොත් බාධාකරන යමෙක් ඇද්ද ඔහු වරදක් කළාක්මෙන් ඒත්තුගනු ලැබේ.

5. ප්‍රධාන නිලධාරීතැනගෙන් හෝ එම නිලධාරීතැන විසින් අවසරපත්‍ර දීම සඳහා බලයදී තිබෙන කෙනෙකුගෙන් අවසර පත්‍රයක් නොගෙන කතරගම වාඩියට හෙවත් වන්දනා සීමාවට හැතැප්ම කාලක් ඇතුළතට ගවයින් හෝ කරත්ත ගොන් යම්කිසි අයකු විසින් ගෙනෙන්නට යෙදුණොත් ඔහු නීතියට විරුද්ධ වරදක් කළහැකියට සලකනුලැබේ. එබඳු අවසර පත්‍ර දෙන්නේ වාඩිය පවිත්‍රව තබවාගැනීම හා එහි සනීපය පවත්වාගැනීම සඳහා ප්‍රධාන නිලධාරීතැන විසින් පනවන නියෝග අනුව අවසරපත්‍ර ලබාගන්නා අය විසින් කටයුතුකරන පොරොන්දුව පිටය.

6. වාඩිය භාර ප්‍රධාන නිලධාරිතැන විසින් මස් විකිණීම සඳහා නියමකර තිබෙන ස්ථානයෙහි හැර යම් මසක් විකුණන අයෙක් හෝ, වෛද්‍ය නිලධාරිතැන විසින් හෝ ඔහු නැතිවිට පොලිසියේ ප්‍රධාන නිලධාරිතැන හෝ විසින් අපථ්‍යයයි කියන ආහාර විකුණන අයෙක් ඇද්ද ඔහු වරදක් කළාක්මෙන් ඒත්තුගනු ලැබේ.

7. යම් අයකු වාඩිය පවත්වන කාලයතුළදී ආණ්ඩුව විසින් ශරීර කෘත්‍යයන් සඳහා සාදා තිබෙන ස්ථානයක හැර වෙන ස්ථානයක ශරීර කෘත්‍යයක් කරන්නට යෙදුණොත් හෝ පහරනලද අශුචි පස්වලින් හෝ වැලිවලින් වසාදමන්නට නොයෙදුණොත් වාඩිය භාර නිලධාරිතැන විසින් ඒ පිණිස නියමකර තිබෙන ස්ථානයට ඉහළින් ගඟේ නාන්නට හෝ ගඟට බහින්නට යෙදුණොත් එකී අය වරදක් කළාක්මෙන් ඒත්තුගනු ලැබේ.

8. බෝවෙන හෝ වසංගත රෝගයකින් පෙළෙන්නාවූ යමකු ඒ බව වෛද්‍ය නිලධාරිතැනට හෝ ඔහු නැතිවිට ප්‍රධාන පොලිස් නිලධාරිතැනට දන්වන්නට නොයෙදුණොත් එවැනි අයද, එසේ රෝගයක් පවතින බව සඟවන හෝ සැඟවීමට උදව්දෙන යම් අයවල් ඇත්නම් ඒ අයවල්ද වරදක් කළාක්මෙන් ඒත්තුගනු ලැබේ.

9. සෑම අයවලුන්ම ගමනේදී සහ කතරගම වාඩියේදී පොලිසියේ ප්‍රධාන නිලධාරිතැන නියමකරණ ස්ථානවල නවාතැන් ගතයුතුයි. එසේ කරන්නට බැරිය කියන්නාවූ හෝ නොකොට පැහැරහරින්නාවූ යම් අයෙක් ඇද්ද ඔහු වරදක් කළාක් මෙන් ඒත්තුගනු ලැබේ.

---

"1898වේ ලෝකල් බෝඩ් සහා ආඥාපණත."

1898වේ ලෝකල් බෝඩ් සහා ආඥාපණතේ 56 වන වගන්තිය යටතේ හා ඒ අනුව තිරිකුණාමලේ ලෝකල් බෝඩ් සභාව විසින් සාදනලදින් ආණ්ඩුකාර ධුරයේ කටයුතුකරන උතුමාණන්වහන්සේ විසින්, කාරක මන්ත්‍රීසභාවේ අනුශාසනය ඇතුව, ස්ථිරකරනලද උපනීතියයි.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්ෂ 1925ක්වූ සැප්තැම්බර් මස 8වන දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඊ. බී. ඇලෙක්සැන්ඩර්,
වැඩබලන මහලේකම් වෙනුව.

උපනීතිය.

1898වේ ලෝකල් බෝඩ් සහා ආඥාපණතේ 56වන වගන්තිය යටතේ තිරිකුණාමලේ ලෝකල් බෝඩ් සභාව විසින් සාදනලදින් වර්ෂ 1925ක්වූ මැයි මස 29වන දින අංක 7,464 දරන ආණ්ඩුවේ ගැසට්පත්‍රයෙහි වර්ෂ 1925ක්වූ මැයි මස 11වන දින දරන දැන්වීමෙන් පළකරනුලැබූ උපනීති අතුරෙන් 75වන උපනීතිය එහි අගට "මාලු ජබ් දැමීම හා වේලීම" යනු එකතුකිරීමෙන් මෙයින් අලුත්වැඩියාකරනු ලැබේ.

---

"1898වේ ලෝකල් බෝඩ් සහා ආඥාපණත."

අවසරපත්‍ර දීම ගැන ලෝකල් බෝඩ් සභාවට ගාස්තුවක් අයකරනහැකියයිද එසේ අයකරන ගාස්තු ගණන් කාරක මන්ත්‍රීසභාගත ආණ්ඩුකාරයාණන් වහන්සේගේ අනුදැනීම ඇතුව සභාව කලින්කල නියමකළයුතුයයිද වර්ෂ 1898වේ ලෝකල් බෝඩ් සහා ආඥාපණතේ 29Aවන වගන්තියෙන් නියමකර තිබෙන බැවින්ද:

වර්ෂ 1925ක්වූ මැයි මස 29වන දින නිකුත්කළ අංක 7,464 දරණ ආණ්ඩුවේ ගැසට්පත්‍රයෙහි පළවූ වර්ෂ 1925ක්වූ මැයි මස 11වෙනි දින-දරන දැන්වීමෙන්, තිරිකුණාමලේ ලෝකල් බෝඩ් සභාව විසින්, කාරක මන්ත්‍රීසභාගත ආණ්ඩුකාර ධුරයේ කටයුතුකරන උතුමාණන්වහන්සේගේ අනුදැන්මත් ඇතුව, එකී දැන්වීමේ සඳහන් යම් යම් කාර්‍ය සඳහා තබනලද ස්ථාන ප්‍රයොජනයට යෙදීම ගැන දෙන අවසරපත්‍රවලට අයකළයුතු ගාස්තු ගණන් නියමකරගත් බැවින්ද:

එකී දැන්වීමෙහි "කළුගල් හෝ කබුක්ගල් වළවල් ...... 50" යනු වැරදීමකින් ඇතුළත්කරතිබෙන බැවින් හා කාරක මන්ත්‍රීසභාගත ආණ්ඩුකාර ධුරයේ කටයුතුකරන උතුමාණන්වහන්සේගේ අනුදැන්ම ඇතුව එකී තිරිකුණාමලේ ලෝකල් බෝඩ් සභාවට එකී වැරදීම හරිගස්සන්නට වුවමනාව තිබෙන බැවින්ද:

එකී තිරිකුණාමලේ ලෝකල් බෝඩ් සභාව විසින් කාරක මන්ත්‍රීසභාගත ආණ්ඩුකාර උතුමාණන්වහන්සේගේ අනුදැන්ම ඇතුව, "1901කේ අර්ථවර්ණනා ආඥාපණතේ" 11Aවන වගන්තිය යටතේ එකී සභාව කෙරෙහි හා උන්වහන්සේ කෙරෙහි පැවරීතිබෙන බලය පවත්වමින්, එකී දැන්වීමේ උපලේඛනයෙහි අන්තර්ගත අයකරන ගණන් ලේඛනයෙන් "කළුගල් හා කබුක් වළවල් ...... 50" යනු අස්කිරීමෙන් එය අවලංගුකරනලද බැව් මෙයින් දන්වනු ලැබේ.

උතුමාණන්වහන්සේගේ අණපරිදි,

වර්ෂ 1925ක්වූ සැප්තැම්බර් මස 8වන දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ඊ. බී. ඇලෙක්සැන්ඩර්,
වැඩබලන මහලේකම් වෙනුව.

---

ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**No. 2,837, C. P.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1926ක්වූ ජනවාරි මස 21වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 10.30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ පාතහේවාහැට කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 7ක්.

මුල් සිතියම 7,865. ගම—උඩදෙල්තොට.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කළුගල්හිතේපතන .. | — .. | පතන .. .. | 3 | 2 | 19 | 80 |
| 2 | කළුගල්හිතේවත්ත .. | (වී. ඒ. ජෝන්සිඤ්ඤෝ විසින් බලහත්කාරයෙන් අල්ලාගෙන තිබේ) | අවුරුදු 10–12ක් වයසඇති තේ | 0 | 0 | 1 | 360 |
| 3 | කළුගල්හිතේපතන .. | — .. | පතන .. .. | 0 | 1 | 31 | —* |
| 4 | ගල්පොතේවත්ත .. | (අංගෙගෙ සාදිරිස් පෙරේරා විසින් බලාහත්කාරයෙන් අල්ලාගෙනතිබේ | අවුරුදු 3–6ක් වයසඇති තේ. | 0 | 0 | 9 | 360 |
| 5 | එම .. | එම .. | එම සහ එළවළුද .. | 0 | 0 | 11 | 360 |
| 6 | කළුගල්හිතේපතන .. | (ගලහවුණේ පදිංචි ආර්. ජුනස් .. | පතන සහ ලඳුකැලේ .. | 2 | 3 | 35 | 80 |
| 7 | එම .. | — .. | එම .. | 0 | 0 | 27 | —* |

* ආණ්ඩුවට ඉතුරුකරනුලැබේ.

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1925ක්වූ නොවැම්බර් මස 12වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඇන්. තේන්,
වැඩබලන මහලේකම් වෙනුව.

**No. 2,838, C. P.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1926ක්වූ පෙබරවාරි මස 2වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1·30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩපලාත කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 20ක්.

මුල් සිතියමේ නො. 6,062. ගම—මුල්ගම.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| $217\frac{1}{2}$ | ගල්පොත්තේවත්ත .. | (ලූකඩගෙදර බබා විසින් බලහත් කාරයෙන් අල්ලාගන තිබේ) | තේ .. .. | 0 | 0 | 13 | 760 |
| $217\frac{1}{3}$ | එම .. | එම .. | එම .. | 0 | 0 | 5 | 760 |
| $217\frac{1}{4}$ | දෙමටගහදෙනියේවත්ත .. | (අඹගහමුල්ලේගෙදර කිරා විසින් බලහත්කාරයෙන් අල්ලාගනතිබේ) | එම . | 0 | 0 | 3 | 610 |
| $217\frac{1}{5}$ | එම .. | (ඉලගොල්ලේගෙදර සිරීමලා විසින් බලහත්කාරයෙන් අල්ලාගනතිබේ) | එම .. | 0 | 0 | 6 | 610 |

මුල් සිතියමේ නො. 7,824. ගම—පල්ලේදෙල්දෙට.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කහටකොස්ගහ මූලේ අස් වැද්දුම | පිලපිටියේගෙදර පිනාදේවයා පදිංචි පල්ලේදෙල්දෙට | පතන අත්හැර දමා තිබෙන කුඹුරක් | 0 | 3 | 25 | 110 |
| 2 | එල්මාකුඹුර නොහොත් කහට කොස්ගහමූලේකුඹුර | (පොල්වතෙනගෙදර කිරියා විසින් බලහත්කාරයෙන් අල්ලාගනතිබේ) | කුඹුර .. | 0 | 0 | 4 | 510 |
| 3 | කහටකොස්ගහමූලේඅස්වැද්දුම | — .. | පාර සහ පතන .. | 0 | 0 | 13 | —* |
| 4 | කහටකොල්ගහමූලේපතන .. | පල්ලේදෙල්තොට පදිංචි පිලපිටියේ ගෙදර පිනා | පතන .. | 1 | 0 | 16 | 110 |
| 5 | කහටකොස්ගහමූලේකැලේ .. | — .. | එම .. | 0 | 0 | 28 | —* |
| 6 | කහටකොස්ගහමූලේපතන .. | — .. | එම .. | 3 | 1 | 17 | 110 |
| 7 | කහටකොස්ගහමූලේකැලේ .. | — .. | මූකලාන .. | 0 | 1 | 17 | 160 |
| 8 | එම .. | — .. | එම .. | 1 | 1 | 17 | —* |
| 9 | කහටගහමූලේපතන .. | — .. | පතන .. | 0 | 2 | 10 | —* |
| 10 | එම .. | ගලහ පදිංචි එච්. මොහොමඩ්කාන් | එම .. | 0 | 2 | 2 | 110 |
| 11 | එම .. | එම .. | එම .. | 4 | 2 | 4 | 110 |
| 12 | එම .. | එම .. | පතන සහ කැලේ .. | 0 | 0 | 11 | 110 |
| 13 | වෑගොඩහුලහවත්ත .. | (නයිනා මොහොමදු විසින් බලහත් කාරයෙන් අල්ලාගන තිබේ) | අවුරුදු අනූපිසිට දහය දක්වා වයසඇති තේ | 0 | 0 | 22 | 410 |
| 14 | එම .. | එම .. | එම .. | 0 | 0 | 11 | 410 |
| 15 | — .. | — .. | වත්තේ පාර .. | 0 | 0 | 13 | —* |
| 16 | — .. | — .. | එම .. | 0 | 0 | 6 | —* |

ආණ්ඩුවට ඉතුරුකර තුලැබේ.

මෙම ඉඩම් ගැන වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්‍ෂ 1925ක්වූ නොවැම්බර් මස 12වෙනි දින කොළඹ
මහලේකම්කාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඇන්. තේන්,
වැඩබලන මහලේකම්කාරිස් වර්‍ෂහ.

---

**No. 2,839, C. P.**— මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්‍ෂ 1926ක්වූ ජනවාරි මස 28වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පස්වරු 1·30ට මහනුවර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩබුලත්ගම කොට්ඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 15ක්.

මුල් සිතියම නො. 7,843 ගම—පෙනිතුඹුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | කරුවදෙනියේමුල්ලේපතන නොහොත් කිතුල්ගොල යා දෙමැද්දේ පතන | — .. .. | පතන .. | 8 | 2 | 22 | —* |
| 2 | එම .. | — .. .. | එම .. | 0 | 0 | 38 | —* |
| 3 | එම .. | නාවලපිටියේ අම්බාගමුව පාරේ පදිංචි පී. ඇස්. පී. සේගු මොයිඩාර් මොහිඩීන් | එම .. | 4 | 3 | 6 | 260 |
| 4 | හඳුන්ගලවත්ත .. | (නාවලපිටියේ හඳුන්ගලවත්තේ පදිංචි බෝවතුර අන්ගෝ විසින් බලහත්කාරයෙන් අල්ලාගන තිබේ) | අවුරුදු 35 වයසැති තේ | 0 | 0 | 10 | 410 |
| 5 | කරුවදෙනියේමුල්ලේපතන නොහොත් කිතුල්කොල යා දෙමැද්දේ පතන | එම .. .. | පතන (අළුත එලිකර තිබේ) | 5 | 1 | 6 | —* |
| 6 | හඳුන්ගලවත්ත .. | එම .. .. | අවුරුදු35ක් වයසැති තේ | 0 | 0 | 7 | 410 |
| 7 | එම .. | එම .. .. | එම .. | 0 | 0 | 22 | —* |
| 8 | බ්‍රිඩ්ගැන් වත්ත .. | (කොඹ්ළ බෝස්ටඩ් සහෝදරයින් සහ සමාගම විසින් බලහත්කාරයෙන් අල්ලාගනතිබේ) | අවුරුදු15ක්පමණව යසැති රබර්ගස්තිබේ | 0 | 3 | 14 | 610 |
| 9 | කරුවදෙනියේ මුල්ලේ ගල | — .. .. | පතන පඳුරුඇතිගල | 0 | 3 | 27 | 75 |

මුල් සිතියම 7,844. ගම—නාවලපිටිය.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 1 | විකන්දේහෙල .. | (ඉල්ලුම්කාරයා විසින් බලහත්කාරයෙන් අල්ලාගන තිබේ) | අවුරුදු 10ක් පමණ වයසැති තේ | 0 | 0 | 18 | 760 |
| 2 | එම .. | නාවලපිටියේ සැම්රොක් වත්තේ සුපිරින් ටැන්ඩන්ට් මහතා වන ඒ. ඕ. ක්‍රොඩාක් | පතන .. | 5 | 2 | 34 | 210 |
| 3 | විකන්දේගොම්මන .. | එම .. .. | මූකලාන .. | 1 | 1 | 3 | —* |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 4 | — | (ඉල්ලුම්කාරයා විසින් බලහත්කාරයෙන් අල්ලාගනතිබේ) | තේ තිබේ | 0 0 1 | —* |
| 5 | — | එම | එම | 0 2 20 | —* |
| 6 | — | එම | එම | 1 0 16 | —* |

* ආණ්ඩුවට ඉතුරුකරනු ලැබේ.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1925ක්වූ නොවැම්බර් මස 12වෙනි දින කොළඹ මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඇන්. තෝන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

---

**No. 2,840, C. P.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1926ක්වූ ජනවාරි මස 18වෙනි දිනවූ සඳුදා පෙරවරු 10·30ට මහනුවර කච්චේරි ගේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩදුම්බර කොරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

මුල් සිතියම 7,397. ගම්—දෙරලියද්ද සහ වතුලියද්ද.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | ඉදිගොල්ලේ හේන | ආණ්ඩුව සහ ඇස්. නාගලිංගම් පී. ඩබ්ලිව්. ඕවර්සියර් | කුරක්කන් වපුරපු හේන | 6 0 14 | 18 |
| 2 | එම | එම | එම | 2 1 20 | 18 |
| 3 | වැවතැන්නේවත්ත | එම | අවුරුදු දෙකේ වයසැති කෙසෙල්ගස් ඇති වැසියන්ගේ ඉඩම, අවුරුද්දක් වයසැති රබර්ද, මාසහයක් වයසැති පොල්පැල 258ක් ඇති පොල්තවානක්ද, පොල්වල වල් සහ ලිඳක්ද, පැලක් සහ ගඩොලින් බැඳි පාළු ගෙයක්ද තිබේ | 7 2 34 | 18 |
| 6 | එම | එම | හේන තාවකාලික පැලක් සහ පොල් වල වල්ද තිබේ | 1 1 3 | 18 |

මෙම ඉඩම් සම්බන්ධව වැඩිදුර විස්තර මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1925ක්වූ නොවැම්බර් මස 16වෙනි දින කොළඹ මහසෙක්‍රතාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඇන්. තෝන්,
වැඩබලන මහසෙක්‍රතාරිස් වම්හ.

---

**No. 2,841, C. P.**—මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1926ක්වූ ජනවාරි මස 18වෙනි දිනවූ සඳුදා පෙරවරු 10·30ට මහනුවර කච්චේරි ගේදී වෙන්දේසිකර විකුණන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩපලාත කොරළයේ පිහිටාතිබෙන බිම්කැබලි 27ක්.

මුල් සිතියම් නො. 7,356 සහ 7,785. ගම්—පල්ලේපිටිය, යටපාත සහ තෙලිහුන්න.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත. අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | දෙකෙටිටලාවේපතන | ආණ්ඩුව | පතන සහ මූකලාන | 9 2 6 | — |
| 2 | පුස්වැල්පතන.. | එම | එම | 6 3 15 | — |
| 3 | ඇතින්නි මැරිච්ච දෙනියේ එල ගොම්මන | එම | මූකලාන සහ පතන | 7 1 28 | — |
| 4 | මැටිහක්කේගොම්මන | එම | මූකලාන | 9 3 9 | — |
| 5 | මඩුකනුවැවේදෙනිය | එම | දෙනිය | 0 1 1 | — |
| 6 | එම | එම | එම | 0 1 2 | — |
| 7 | හපුගහමැදේපතන | එම | පතන | 0 0 33 | — |
| 8 | හපුගහමැදේගොම්මන | එම | මූකලාන | 6 2 28 | — |
| 9 | කළුගල්ගොඩෙහින්න සහ මඩුකනු වැවේපතන | එම | පතන | 27 1 16 | — |
| 10 | කළුගල්ගොඩෙහින්න | එම | එම | 1 1 29 | — |
| 11 | පරගොල්ලේගොම්මන | එම | මූකලාන | 0 0 15 | — |
| 12 | එම | එම | එම | 0 1 35 | — |
| 13 | එම | එම | එම | 0 2 6 | — |
| 14 | පරගොල්ලේපතන | එම | පතන | 47 0 20 | — |
| 15 | රජාඇලවත්ත | (ගම්පොල පදිංචි ඩබ්ලිව්. ජී. ජී. අබේසිංහ විසින් බලහත්කාරයෙන් අල්ලාගන තිබේ) | අවුරුදු 6ක් වයසඇති තේපඳුරු තිබේ | 0 0 7 | — |
| 16 | එම | එම | අවුරුදු 10ක් වයසැති තේපඳුරු සහ දිරාගිය කුලීකාරයින්ගේ ලයිමක කොටසක් | 0 3 5 | — |
| 17 | පරගොල්ලේගොම්මන | ආණ්ඩුව | මූකලාන | 4 3 29 | — |
| 18 | එම | එම | එම | 1 2 15 | — |
| 19 | එම | එම | මූකලාන සහ පතන | 19 3 9 | — |
| 20 | එම | එම | මූකලාන | 0 0 37 | — |
| 21 | එම | එම | එම | 0 1 14 | — |
| 22 | එම | එම | එම | 0 0 13 | — |
| 23 | පරගොල්ලේපතන | එම | පතන | 0 3 17 | — |
| 24 | පරගොල්ලේගොම්මන | එම | මූකලාන සහ පතන | 4 2 6 | — |
| 25 | පරගොල්ලේපතන | එම | පතන | 18 1 9 | — |

මුල් සිතියම 7,785.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම, | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | මහකඳෙනිය නොහොත් ගල් ආණ්ඩුව කොටුව | .. | — | .. 0 1 0 | 150* |
| 2 | එම .. | එම .. | — | .. 0 1 23 | 150* |

* නැවත ප්‍රසිද්ධකරණලදී.

ඉතුරු බිම්කැබෙලි සියල්ලම ආණ්ඩුවට ඉතුරුකරනු ලැබේ.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණ මධ්‍යම දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1925ක්වූ නොවැම්බර් මස 18වෙනි දින කොළඹ මහලේකම්තාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඇන්. තේන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්ශ.

---

**No. 4,329, S. P.**—දකුණු දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩු සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1926ක්වූ ජනවාරි මස 19වෙනි දිනවූ අඟහරුවාදා පස්වරු 1·30ට ගාල්ලේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෝජනාවා ඇත. දකුණු දිසාවේ ගාලු පළාතේ බෙන්තොට වලල්ලාවිටිකෝරළේ සහ තල්පේපත්තුවේ පිහිටා තිබෙන බිම්කැබලි 35ක්.

මුල් සිතියමේ නො. 11,806. ගම—නවදගල. අයිතිකමකියන්නා—රජසන්තක.

(බෙන්තර වලල්ලාවිටිකෝරළේ තිබෙන ඉඩම්.)

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 5 | අටකොහොම්ටකැන්නමානන නොහොත් බතලවල | නවදගල පදින්චි පී. ඒ. අමනේරිස් .. | සුළුබැද්ද .. | 0 3 12 |

මුල් සිතියම 11,009. ගම—පොල්අතුපලාත.

| | | | | |
|---|---|---|---|---|
| 2 | කබවලකන්දේගොඩැල්ල .. | කොස්ගොඩ ඇල්. පී. ඒ. වික්‍රමරත්න සහ පී. ඇම්. අබේසේකර | බැද්ද .. | 0 1 16 |

මුල් සිතියම 12,114. ගම—උතුරු මාගල.

| | | | | |
|---|---|---|---|---|
| 6 | හොදපාලුවේමානාන .. | උතුරු මාගල පදිංචි එව්. දේවඑර .. | වත්ත .. | 0 1 30 |

මුල් සිතියම 12,167. ගම—නවදගල.

| | | | | |
|---|---|---|---|---|
| 1 | ගොරකගහවෙල නොහොත් අටකොහොම්ටවෙල | — .. .. | කුඹුර .. | 3 1 33* |

මුල් සිතියම 12,473. ගම—ඕපාත.

| | | | | |
|---|---|---|---|---|
| 1 | ගහඅද්දරඹිට .. | ඕපාත පදිංචි යූ. කරනේරිස්අප්පු, ඇස්. ජේම්ස් අප්පු සහ ඇස්. සේදිරිස්සිඤ්ඤෝ | ඔවිට .. | 2 3 35 |

අයිතිකමකියන්නා—ඕපාත පදිංචි කරනේරිස්, ජේම්ස් සහ සේදිරිස්.

| | | | | |
|---|---|---|---|---|
| 2 | ගහඅද්දරවෙල .. | ඕපාත පදිංචි යූ. කරනේරිස්අප්පු, ඇස්. ජේම්ස් අප්පු සහ ඇස්. සේදිරිස්සිඤ්ඤෝ | කුඹුර .. | 2 0 2 |

අයිතිකමකියන්නා—රජසන්තක.

| | | | | |
|---|---|---|---|---|
| 3 | ඇලමෝදරකුඹුර .. | — .. .. | එම .. | 0 1 10 |

මුල් සිතියම 12,851. ගම—ඇලකක.

| | | | | |
|---|---|---|---|---|
| 1 | බෝගහගොඩ නොහොත් කනාබෙන් තොටකැලේ | මොරටුවේ පදිංචි ඒ. ඇල්. මොහම්මදු .. | සනබැද්ද .. | 2 3 26 |
| 2 | එම .. | — .. .. | සුළුබැද්ද .. | 6 0 33 |

අයිතිකමකියන්නෝ—හබුරුගල පදිංචි එච්. එගෝරිස්අප්පු සහ ඇන් බිව්චන්හාමි.

| | | | | |
|---|---|---|---|---|
| 3 | දියකඩිත්තේගොඩවත්ත .. | — .. .. | කුරුඳුවත්ත | 0 0 3 |

අයිතිකමකියන්නෝ—හබුරුගල පදිංචි ඒ. හෙන්ද්‍රික්සිඤ්ඤෝ, ඩබ්ලිව්. දනියෙල්අප්පු සහ ඩබ්ලිව්. බාරොන්අප්පු.

| | | | | |
|---|---|---|---|---|
| 4 | උටුකටුගොසිපලලගවත්ත නොහොත් කටුඅතුඋඹුමුල්ලේවත්ත | — .. .. | වත්ත .. | 0 0 27 |

මුල් සිතියම 11,985. ගම—තෙලම්බරේ. අයිතිකමකියන්නා—රජසන්තක.

(තල්පේපත්තුවේ තිබෙන ඉඩම්.)

| | | | | |
|---|---|---|---|---|
| 1 | ගල්ලවත්තේගොඩ නොහොත් පිටමල්ලියද්දේගොඩ | — .. .. | හේන .. | 0 1 31 |

මුල් සිතියම 12,011. ගම—පොල්පාගොඩ.

| | | | | |
|---|---|---|---|---|
| 2 | තලකොළේකුඹුරඅද්දර නොහොත් තලකොළේපිටිවෙනිය | — .. .. | දෙනිය .. | 0 1 6 |

මුල් සිතියම 12,363. ගම—උනවටුන නැගෙණහිර.

| | | | | |
|---|---|---|---|---|
| 3 | කහටගහවත්ත .. | — .. .. | මුඩුබිම .. | 0 0 9 |

මුල් සිතියම 12,750. ගම—මායාකඩුව. අයිතිකමකියන්නා—මායාකඩුවේ පදිංචි සාලිස්හාමිගේ උරුමක්කාරයෝ.

| | | | | |
|---|---|---|---|---|
| 1 | මිදූල්ලදෙලගොඩ .. | මායාකඩුවේ පදිංචි ඇම්. සාලිස්හාමි .. | වත්ත .. | 0 1 20 |

අයිතිකමකියන්නා—මායාකඩුවේ පදිංචි කේ. ජේම්ස්

| | | | | |
|---|---|---|---|---|
| 2 | මිදූල්ලදෙලගොඩදූව නොහොත් මිදූල්ලදෙලගොඩ | මායාකඩුවේ කේ. ජේම්ස් .. .. | එම .. | 0 2 36 |

අයිතිකමකියන්නා—රජසන්තක.

| | | | | |
|---|---|---|---|---|
| 3 | වැලිකොරටුවේගොඩ නොහොත් මිදූල්ලදෙලදූව | මායාකඩුවේ පදිංචි කේ. අල්ලිස්හාමි .. | හේන .. | 0 2 8 |

අයිතිකමකියන්නා—මායාකඩුවේ පදිංචි අල්ලිස්හාමි.

| | | | | |
|---|---|---|---|---|
| 4 | වැලිකොරටුවේගොඩවත්ත .. | මායාකඩුවේ හදිංචි කේ. අල්ලිස්හාමි .. | වත්ත .. | 0 2 5 |

අයිතිකමකියන්නා—මායාකඩුවේ පදිංචි තොරෝනිස්.

| | | | | |
|---|---|---|---|---|
| 5 | මිදූල්ලෙදෙලේදෙනිය .. | මායාකඩුවේ පදිංචි ඇම්. තොරෝනිස් .. | ඔවිට .. | 0 1 0 |
| 6 | කැතිලුහේනේගොඩ නොහොත් මිදූල්ලගහවත්තේගොඩ | එම .. .. | වත්ත .. | 0 2 21 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| | **මුල් සිතියම 12,764. ගම—අගුලුගහ. අයිතිකමකියන්නා—රජසන්තක.** | | | | | |
| 1 | මුල්ලේවත්තේගොඩ නොහොත් කුන්දප්පකන්ද නොහොත් අරඹවත්තේගොඩ | බටදූවේ පදිංචි ඩී. ඇල්. ඇස්. ඩී. ද සිල්වා .. | සනබැද්ද .. | 1 | 3 | 39 |
| 2 | කුන්දප්පකන්දේකැලේ .. | අගුලුගහ පදිංචි කේ. අබරන් .. .. | එම .. | 1 | 0 | 14 |
| 3 | අරඹේයේවත්තේඉහල කැබැල්ල නොහොත් කුන්දප්පකන්ද | අගුලුගහ පදිංචි ඒ. ජී. අදිරියන් .. | හේන .. | 2 | 0 | 3 |
| 4 | එම .. | — .. .. | සනබැද්ද .. | 0 | 2 | 3† |
| | **අයිතිකමකියන්නා—අගුලුගහ පදිංචි ඒ. ජී. අදිරියන්.** | | | | | |
| 5 | එම .. | — .. .. | වත්ත .. | 0 | 1 | 22 |
| 6 | එම .. | — .. .. | බැද්ද .. | 0 | 0 | 35 |
| | **මුල් සිතියම 12,776. ගම—උණවටුන. අයිතිකමකියන්නා—රජසන්තක.** | | | | | |
| 1 | රෝසිගේවත්ත .. | — .. .. | වගුර .. | 0 | 3 | 19† |
| 2 | එම .. | — .. .. | එම .. | 1 | 0 | 36·6 |
| | **අයිතිකමකියන්නා—උණවටුනේ ටී. කේ. සාමියෙල් ද සිල්වා.** | | | | | |
| 3 | එම .. | — .. .. | වත්ත .. | 1 | 0 | 18 |
| | **අයිතිකමකියන්නා—රජසන්තක.** | | | | | |
| 4 | එම .. | — .. .. | වගුර .. | 0 | 1 | 1·5 |
| 5 | එම .. | — .. .. | වත්ත .. | 0 | 0 | 12·2† |
| | **මුල් සිතියම 12,719. ගම—හියාරේ.** | | | | | |
| 1 | කැටදෙලබැද්ද නොහොත් මූකලානහේන | — .. .. | එලිකරපු හේන | 1 | 0 | 20† |
| 2 | එම .. | ගාල්ලේ කේ. ජී. මාර්ෂල්අප්පු .. .. | එම .. | 3 | 3 | 32 |
| | **මුල් සිතියම 12,753. ගම—බස්නාහිර හරුමල්ගොඩ.** | | | | | |
| 1 | පෝක්කුලුකන්ද .. | මීපේ පී. ජී. අරනෝලිස් .. .. | සුළුබැද්ද .. | 9 | 3 | 4 |
| 2 | එම නොහොත් තැඹිලිපහේපැල වත්තේගොඩ | බස්නාහිර හරුමල්ගොඩ ඩබ්ලිව්. බාලඅප්පු .. | එම .. | 1 | 0 | 3 |
| | **මුල් සිතියම 12,888. ගම—හියාරේ.** | | | | | |
| 1 | කැටදෙලදෙනියේහේන .. | — .. .. | හේන .. | 0 | 0 | 3† |
| 2 | එම .. | මැටරඹ කේ. ජී. මාර්ෂල්අප්පු .. .. | එම .. | 1 | 0 | 23 |
| 3 | එම .. | — .. .. | එම .. | 0 | 3 | 19† |
| | **මුල් සිතියම 12,882. ගම—උඩුබැවිටව.** | | | | | |
| 1 | වැවේගොඩකන්ද නොහොත් ගිනිගල්ගොඩැල්ලේකන්ද | — .. .. | බැද්ද .. | 0 | 1 | 13† |
| | **ගම—තල්ගම්පොල.** | | | | | |
| 2 | එම .. | — .. .. | එම .. | 0 | 0 | 39† |
| 3 | එම .. | — .. .. | එම .. | 0 | 0 | 30† |
| 4 | එම .. | ගාල්ලේ ආර්. අමරසූරිය .. .. | එම .. | 3 | 2 | 2 |
| 5 | එම .. | එම .. .. | එම .. | 10 | 0 | 19 |
| | **මුල් සිතියම 12,936. ගම—තෙල්ලම්බුරේ.** | | | | | |
| 1 | කුවිචියඋඩුමුල්ල .. | කපුහේම්පල ඩී. පී, ජයසුන්දර .. .. | සුළුබැද්ද .. | 1 | 3 | 36 |

* මෙම ඉඩම මිනිරන් හෑරීමේ බලෙත් ඇතුව විකුණනු ලැබේ. † කහනම් ඉඩම. (විකුනන්නේ නැහැ.)

මෙම ඉඩම්වල තක්සේරු මිල විකිනීමේදී දන්වනුලැබේ.

මෙම ඉඩම්වල වැඩිදුර කාරණ දකුණු දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවාගේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වම් 1925ක්වූ නොවැම්බර් මස 12වෙනි දින කොළඹ මහලේකම්තුමාරීස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඇන්. තේන්,
වැඩබලන මහලේකම්තාරිස් වම්හ.

---

**No. 1,553, P. of U.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1926ක්වූ ජනවාරි මස 25වෙනි දිනවූ සඳුද පස්වරු 1.45ට බදුල්ල කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල පලාතේ උඩුකිද, යටිකිද, වෙල්ලස්ස කොඨාසවල පිහිටා තිබෙන බිම්කැබලි 29ක්.

අන්තිම ගම් සිතියමේ නො. 59. ගම—උඩුකිද පලාත දඹවිනිපලාත කෝරලේ දඹවින්න.

අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. | රූ. | ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|
| 11D | හිම්බුටුවැල්හින්නේපතන නොහොත් දඹෙබිගොල්ලේගොඩ නොහොත් දඹෙබිගොල්ලේහේන | ඒ. පී. පොන්නුසාමි කන්කානි .. | හේන, අන්නාසි සහ කෙසෙල්ගස් තිබේ | 1 | 2 | 24 | 75 |
| 11D1 | දඹගොල්ලේහේන .. | — .. | හේන, මැදකඳුරට ඉතුරුකරතිබේ | 0 | 2 | 21 | —* |
| 11E1 | දඹගොල්ලේපතන .. | කේ. කුත්තකුච්චි .. | පතන .. .. | 2 | 0 | 9 | 75 |
| 11E2 | එම .. | එම .. | හේන, මැදකඳුරට ඉතුරුකරතිබේ | 1 | 0 | 18 | —* |
| | **අන්තිමගම් සිතියමේ නො. 44. ගම—උඩුකිද පලාත දෙහිවිනිපලාත කෝරලේ යහල්අරාව.** | | | | | | |
| 4 | කිරින්දිඇල්ලේපතන .. | අයි. ඇන්. ඇම්. කිරිබංඩා ගමරාල | පතන .. .. | 6 | 3 | 23 | 75 |
| 3P12 | එම .. | එම .. | එම .. .. | 7 | 1 | 26 | 75 |
| 36A | දඹකොටුවේපතන .. | — .. | එම කොබෝගහට ඉතුරුකර තිබේ | 0 | 0 | 35 | —* |
| 3P13 | කිරින්දිඇල්ලපතන .. | ආර්. එච්. එච්. ඇම්. පුන්චිරාල .. | පතන .. .. | 8 | 0 | 38 | 75 |
| 3P14 | එම ... | — .. | එම ගන්සභාපාරට ඉතුරුකරතිබේ | 0 | 1 | 27 | —* |
| 3P15 | දරන්දේමකලාන .. | — .. | බැද්ද ඉතුරුකර තිබේ .. | 0 | 1 | 32 | —* |
| 3P16 | කිරින්දිඇල්ලපතන .. | ආර්. එච්. එච්. ඇම්. පුන්චිරාල .. | පතන .. .. | 1 | 2 | 23 | 75 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 3Q | උඩමදිත්තේපතන නොහොත් බුද්දියාවගුරෙ පතන | ඩී. වී. කිරිහතා | පතන | 2 0 11 | 75 |
| 3R | උඩමදිත්තේපතන | — | එම අඹිපාරට ඉතුරුකර තිබේ | 0 0 20 | —* |
| 3S | එම | — | පතන, පාරට ඉතුරුකර තිබේ | 0 0 13 | —* |
| 3G3 | දමතේගොඩපතන | වයි. අයි. පී. මහිමා | පතන | 1 3 37 | 75 |
| | අත්තිමගම් සිතියමේ නො. 77. ගම—වෙල්ලස්ස පලාත දඹගල්ලකෝරලේ ගල්බොක්ක. | | | | |
| 1B | දෙනියේපිටියේහේන | ජී. ඒ. දිංගියා | හේන | 1 0 21 | 30 |
| 1D | එම | ජී. ඒ. ඩබ්ලිව්. කිරිමැනිකා | එම | 1 0 22 | 30 |
| 1G | එම | ඈස්. බන්ඩියා | එම | 0 3 39 | 30 |
| 1H | දෙහිගහහේන | එම | එම | 0 1 38 | 35 |
| 1I | කොකපියරෙද්දේහේන | ඒ. දිංගුවා | එම | 0 0 35 | 35 |
| 1J | නුගගහගාවහේන | ඒ. සුවන්දේ | එම | 1 0 13 | 30 |
| 1K | එම | එම | එම | 0 3 0 | 30 |
| 14D | කොකපියහේන | ඈස්. බන්ඩියා | එම | 0 0 16 | 30 |
| 14E | එම | ජී. දිලියන්ගුවා | එම කෙසෙල් පඳුරු 3ක් තිබේ | 0 0 27 | 35 |
| 14G | නුගගහගාවහේන | ඒ. සුවන්දේ | හේන | 0 1 12 | 30 |
| | අත්තිමගම් සිතියමේ නො. 2. ගම—යටිකිද පලාත කුඹල්වැල්ලකෝරලේ ගොටුවෙල. | | | | |
| 14N | ගොරදියේකොටේ පතන නොහොත් වතගොඩ පතන | — | පතන | 3 3 34 | 100 |
| 14O | එම | ඒ. ඇම්. සුදුමැනිකා | එම | 1 0 4 | 100 |
| | අයිතිකම්කියන්නා—ආණ්ඩුව ඉල්ලුම්කාරයා විසින් අයුත්තේ බුක්තිවිඳියි. | | | | |
| 14P | ගුරුස්සගහරුව | ඒ. ඇම්. සුදුමැනිකා | කුඹුර වවලා තිබේ | 0 3 11 | 250 |
| 14R | ගෙදරරුව | ඇම්. කිරිහතා | එම | 0 0 23 | 250 |

* විකුණන්ට නොව, (නොවිකුණ ඉතුරුකිරීමට.)

මෙම ඉඩම් ගැණ වැඩිදුර කාරණ ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරල් තැනගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1925ක්වූ නොවැම්බර් මස 17වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඇන්. තේන්,
වැඩබලන මහලේකම් වමහ.

---

No. 7,535, S. O.—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1926ක්වූ ජනවාරි මස 7වෙනි දිනවූ බ්‍රහස්පතින්ද පෙරවරු 9·30ට නම්බාපානේ තානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ නිරවුල්කරදෙන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුරේ පලාතේ කුරුවිටිකෝරලේ මැදපත්තු කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 18ක්.

ලංකාබැනීමේ මුල් සිතියම 218. ගම—යටිපාවිට.

| නො. | ඉඩමේ නම. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 182 | එමලිනාවත්ත | (1) ඩී. ජේ. ජයරත්න දෙස්තර, (2) ඩික්මන් ද මැල්, (3) කොළඹ ඔඩිට්කන්තෝරුවේ සී. ඇල්. ප්‍රනාන්දු | රබර් | 3 1 11 |
| 183 | එම | (1) ඩී. ජේ. ජයරත්න දෙස්තර, (2) සී. ඇල්. ප්‍රනාන්දු | හේන | 2 0 3 |
| 184 | එම | (1) ඩී. ජේ. ජයරත්න දෙස්තර, (2) ඩික්මන් ද මැල්, (3) සී. ඇල්. ප්‍රනාන්දු | රබර් | 5 0 19 |
| 186 | හීන්මිරියේදෙනිය | (1) ඩී. ජේ. ජයරත්න දෙස්තර, (2) විතාරන පතිරන්නැහෙලාගේ විජේහාමි, (3) සී. ඇල්. ප්‍රනාන්දු | ගොවිතැන් නොකළ දෙනිය | 0 1 3 |
| 188 | එමලිනාවත්ත | (1) ඩී. ජේ. ජයරත්න දෙස්තර, (2) ඩික්මන් ද මැල්. (3) සී. ඇල්. ප්‍රනාන්දු | පොල්අතු සෙවිලි බංගලාවක් සහිත වත්ත | 1 2 38 |
| 189 | එම | (1) ඩී. ජේ. ජයරත්න, දෙස්තර (මාදෙලවත්තේ ඩික්මන් ද මැල් මහතාට බදුදී තිබේ) (2) සී. ඇල්. ප්‍රනාන්දු | රබර් | 2 2 15 |
| 272 | හීන්මිරියේවත්ත | ඩී. ජේ. ජයරත්න දෙස්තර, පතිරආරච්චිලාගේ පුංචිරාල විරුඬව අයිතිවාසිකම් කියයි | කැලෑසහිත වත්ත | 3 0 5 |
| 274 | දුම්මලගහහේන නොහොත් හීන්මිරියේ වත්ත | ඩී. ජේ. ජයරත්න දෙස්තර | රබර් | 0 1 31 |
| 107 | ඇල්ලේකන්දේ වත්ත නොහොත් ඇල්ලේ ගෘප | (1) මොරටුවේ පදිංචි ඩී. ඒ. ප්‍රනාන්දු (2) ඇල්ලේකඳුරලලාගේ අප්පුසිඤ්ඤෝ (3) එම තේමිස්අප්පුහාමි, (4) ඇල්ලේ කඳුරලලාගේ රත්රන්හාමි රෙජිස්ට්‍රාර්, (5) එම සිලිඳුහාමි, (6) එම ඒ. පඤ්ඤාතිස්ස, (7) එම පිටර්සිඤ්ඤෝ, (8) එම ඇල්පිනෝනා, (9) එම කිරිමැතිතේ | එම | 42 3 6 |
| 481 | මුංගානෙලවතුරුව | කොළඹ රෝස්මිඩ් ප්ලේස්හි ඒ. සී ද පොන්සේකා | එම | 0 1 10 |
| 3 | අඑබෝගහහේන | ආණ්ඩුව, මොරටුවේ ඩී. ඒ. ප්‍රනාන්දුගේ වගාව | වත්ත | 5 0 16 |
| 100 | ඉදිවැටියේවත්ත | ආණ්ඩුව, (1) වෙත්තසිංහගේ ජුවානිස්, (2) බමුනුගේ ආරොන් සිඤ්ඤෝගේ වගාව | රබර්හේන | 4 0 19 |
| 101 | එම | ආණ්ඩුව, (1) විතාරනපතිරන්නැහෙලාගේ වීංජ්හාමි, (2) පහාවැල්සෝරලලාගේ සීපිනෝනා. (3) වැත්තසිංහ ආරච්චිගේ ජුවානිස්අප්පුහාමි, (4) වැත්තසින්ගේ මර්තේනිස් සහ මොරටුවේ හැන්රි පිටර් ඩික්මන් ද මැල් විසින් අයිතිවාසිකම් කියයි | වත්ත | 0 0 36 |
| 102 | ඉදිවැටියේකුඹුර | ආණ්ඩුව, විතාරනගේ වගාව | කුඹුර | 0 1 27 |

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 103 | ඉඳිවැටියේ හේන්යාය. විතානකන්දේහේන්යාය | (1) මොරටුවේ පදිංචි හැන්රිපීටර් ඩික්මන් ද මැල්, (2) ඉංගිරියේ (දැනට ගාල්ලේ) පදිංචි ජී. මැන්දිස් නෝනා | හේන | .. 19 3 14 |
| 105 | ඇල්ලේකන්දේවත්ත නොහොත් ඇල්ලේ ගැප් | ආණ්ඩුව, (1) ඇල්ලේකපුරාල්ලාගේ රත්රන්හාමි රෙජිස්ට්‍රාර්, (2) ඇල්ලේ කපුරාලලාගේ අප්පුසිංඤෝ, (3) එම තේමිස් අප්පුහාමි, (4) එම සිලිඳුහාමි, (5) එම ඊ. පඤ්ඤාතිස්ස, (6) එම පීටර්සිංඤෝ, (7) එම ඇල්පිනෝනා, (8) එම කිරිමැණිකේ | රබර් | .. 59 3 24 |
| 421 | මාදෙලඇස්වේච් .. | ආණ්ඩුව, මොරටුවේ පදිංචි ජේ. එච් ද මැල් සහ එච්. ජී. ද මැල්ගේ වගාව | එම | .. 0 1 13 |
| 422 | හත්බෑවේහේන, මාදෙල ඇස්වේච් | එම .. .. .. | හේන | .. 11 2 33 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 20 සිට රුපියල් 200 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිය.

වර්ෂ 1925ක්වූ නොවැම්බර් මස 17වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඇන්. තෝන්,
වැඩබලන මහලේකම් වෙනුවට.

---

**No. 7,536, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1926ක්වූ ජනවාරි මස 21වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට කුලියාපිටියේ තානායමේදී විකුණන්ට නොහොත් බේරුම්කරදෙන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පොල හත්පත්තුවේ කරඳපත්තුකෝරළේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 4ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 2,089 ගම—රිච්ඡාදෙණිය දඹපිටිය.

| නො. | ඉඩමේ නම. | අයිතිකාරකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 3 | අඹගහමුලවත්ත .. | බාලසූරිය මුදියන්සේලාගේ ඩින්ගිරිමැණිකේ .. | පොල් ඉඩම | .. 0 1 30 |
| 5 | නුගගහමුලවත්ත .. | හසිංවලපතිරන්නැහේලාගේ අබිලින් නෝනා ... | එම | .. 1 2 2 |
| 6 | එම .. | ලියන පතිරන්නැහේලාගේ සියප්පුහාමි .. .. | එම | .. 2 3 8 |
| 15 | කෝන්ගහමුලවත්ත .. | (1) තෙන්නකෝන් මුදියන්සේලාගේ අප්පුහාමි, (2) රණවිර ආරච්චිලගේ පිලෝරිස් අප්පුහාමි, (3) අලහකෝන් පතිරන් නැහේලාගේ සර්දියල් (4) තෙන්නකෝන් මුදියන්සේලාගේ බන්ඩිඑතනා, (5) එම කිරිබන්ඩා | එම | .. 14 3 27 |

අක්කරයක තක්සේරු මිල රුපියල් 20 සිට රුපියල් 75 දක්වාය.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1925ක්වූ නොවැම්බර් මස 17වෙනි දින කොළඹ මහලේකම් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

ආර්. ඇන්. තෝන්,
වැඩබලන මහලේකම් වෙනුවට.

---

**No. 7,537, S. O.**—ඉඩම් බේරුම්කරණ කොමසාරිස් උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1926ක්වූ ජනවාරි මස 21වෙනි දිනවූ බ්‍රහස්පතින්දා පෙරවරු 9ට කුලියාපිටියේ තානායමේදී වෙන්දේසිකර විකුණන්ට නොහොත් බේරුම්කරදෙන්ට යෙදෙනවා ඇත. වයඹ දිසාවේ කුරුණෑගල පලාතේ කටුගම්පොල හත්පත්තුවේ කරඳපත්තුකෝරළේ කොට්ඨාසයේ පිහිටාතිබෙන බිම්කැබලි 9ක්.

ලංකාමැනීමේ මුල් සිතියම 2,088. ගම—හැකහිදම්පිටිය.

